# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,464 - 2006 සැප්තැම්බර් 22 වැනි සිකුරාදා - 2006.09.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 822 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 822 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 823 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 සැප්තැම්බර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 286

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ඒ. ජී. ධර්මදාස මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වශයෙන්,

09-661

# ආණ්ඩුවේ නිවේදන

ප්‍ර. නො. 11/2/35/07/2006/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවන තීරුවේ සඳහන් ඉඩම සහ තුන්වන තීරුවේ සඳහන් ඔප්පුවලට අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත් පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය)ආඥාපනතේ 4 වන වගන්තියට අනුව මෙයින් පෙනී යයි.

02. වර්ෂ 2006 සැප්තැම්බර් මස 25 වැනි දින සිට 2006 ඔක්තෝබර් 09 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2006.10.16 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උපලේඛනය

| *ඉඩම් ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 660 දරන වෙලුමේ 215 දරන පත්‍රිකාව | කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ අලුත්කුරු කෝරළයේ අඹතලෙන් පහළ පත්තුවේ කිත්තම්පහුව නැමැති ගමේ පිහිටි අ. 0, රූ. 0, පර්. 3.75ක් විශාලත්වයෙන් යුත් මුරුතගහවත්ත නැමැති ඉඩමේ ලොට් 6 දරන කොටස සඳහා එස්. එච්. පීරිස් මානක විසින් 1986.06.15 දින මැන සකස් කරන ලද අංක 5120 දරන පිඹුර ප්‍රකාර මායිම් :<br>*උතුරට* :- මෙම ඉඩමේ ලොට් 01 ;<br>*නැගෙනහිරට* :- මෙම ඉඩමේ ලොට් 02 ;<br>*දකුණට* :- ලොට් 01 ;<br>*බස්නාහිරට* :- අබුටාවිට වත්ත සහ ඕවිට. | 01. එස්. සී. සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1989.06.13 දින ලියා සහතික කරන ලද අංක 760 දරන විකුණුම් ඔප්පුව<br>02. ඩී. එන්. සෙල්වදුරෙයි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1989.09.20 දින ලියා සහතික කරන ලද අංක 2029 දරන විකුණුම් ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 660 දරන වෙලුමේ 214 දරන පත්‍රිකාව | කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ අලුත්කුරු කෝරළයේ අඹතලෙන් පහළ පත්තුවේ කිත්තන් පවුල නැමැති ගමේ පිහිටි අ. 0, රූ. 2, පර්. 4 ක විශාලත්වයෙන් යුත් මුරුතගහවත්ත නැමැති ඉඩමේ ලොට් 4 දරන කොටස සඳහා එස්. එච්. පීරිස් නැමැති මානක විසින් 1986.06.15 දින මැන සකස් කරන ලද අංක 5120 දරන පිඹුර ප්‍රකාර මායිම් :<br>*උතුරට* : ලොට් 03 ;<br>*නැගෙනහිරට* : ජී. එච්. කරුණාරත්නගේ ; උරුමක්කරුවන්ට අයිති ඉඩම ;<br>*දකුණට* : ගෝතමී මාවත ;<br>*බස්නාහිරට* : ලොට් 5. | 01. එස්. සී. සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1989.06.13 දින ලියා සහතික කරන ලද අංක 760 දරන විකුණුම් ඔප්පුව<br>02. ඩී. එන්. සෙල්වදුරෙයි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1989.09.20 දින ලියා සහතික කරන ලද අංක 2029 දරන විකුණුම් ඔප්පුව |

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280, කෙළින් වීදිය, කොළඹ 11.

09-694

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 90428.

2004 මාර්තු මස 26 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

"කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද, 2000 අගෝස්තු මස 04 වැනි දින හා අංක 746 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ෂර්මේන් ජොසෆින් ද වෙසර් ණයකරු සහ උකස්කරු හැටියටද සහ කරුණානායකගේ ජෝර්ජ් ශාන්තද සිල්වා ණයකරු හැටියට ද පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසි දෙලක්ෂ හාරසිය දහනවයයි ශත අනූවක (රු. 22,00,419.90) මුදලක් 2004 ජනවාරි මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිදෙලක්ෂ හාරසිය දහ නවයයි ශත අනූවක (රු. 22,00,419.90) මුදලට 2004 ජනවාරි මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,68,500ක මුදල සඳහා වාර්ෂිකව 19.5% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 746 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තරකොට ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.".

### උපලේඛනය

බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා විසින් 1993 නොවැම්බර් මස 12 වැනි දින සාදන ලද අංක 12603 දරන පිඹුරේ පෙන්වා ඇති බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරිපත්තු සියනෑ කෝරළේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ අංක 1 දරන උප කාර්යාල සීමාවේ මහර කැන්දලියද්ද පාලුව පිහිටි දෙල්ගහවත්ත, අඹගහදෙනිය සහ අඹගහවත්ත හෙවත්තුන්හවුල් කුරුඳුගහවත්ත ඉඩමේ කොටසක පිහිටි ගොඩනැගිල්ල සහ වෙනත් සියළුදේත් සමග වෙන්කරන ලද ලොට් "එෆ්" දරන කොටසට එකී අංක 12603 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : පී. සී. වැලිවිටට හිමි අංක 12342 දරන පිඹුරේ ලොට් "1ජී" ද, නැගෙනහිරට : කේ. ඒ. අගෝසිංඤෝට හිමි ඉඩමද, දකුණට : ලොට් "ඊ" සහ ලොට් "එච්" ද සහ බස්නාහිරට : ලොට් "ජී" ද යන මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 419/159 යටතේ ලියාපදිංචිව ඇත.

එකී අංක 12603 දරන පිඹුරේ ලොට් 9 සහ "එක්ස්" ලෙස ලකුණුකොට පාරක් සඳහා වෙන්කොට ඇති බිම් තීරය තුළ මතුපිටින් සහ ඔස්සේ ගමන් කිරීමේ අයිතිය ද සමග වේ.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

09-679

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-පුත්තලම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2006 ජූලි මස 27 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

"පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ඉක්බාල් විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ ද 2004.10.12 දින සහ අංක 23283 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සෙයියදු මොහොමඩ් මොහොමඩ් ෆියාස් ණයකරු හැටියටද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අසූදහස් එකසිය අසූනමයයි ශත තිස්නමයක (රු. 180,189.39) මුදලක් 2005.11.29 වැනි දින විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 180,189.39ක මුදලට 2005.11.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 23283 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය කොට්ඨාසයේ, උතුරු අක්කරපත්තුවේ, තිහාලියේ පිහිටි 'සින්න තොතම්' සහ 'වීදාදී තොතම්' නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ජේ. ඒ. වී. රාජනායගම් විසින් 2004.06.12 වන දින අංක 4302 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ඉඩමට උතුරට : අඩි පාරෙන් ද, නැගෙනහිරට : කල්පිටිය පාරෙන්ද, දකුණට : එස්. එස්. අබ්දුල් කසීම්ගේ ඉඩමෙන් ද සහ බටහිරට : එස්. එස්. අබ්දුල් කසීම්ගේ ඉඩමෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දෙකක් (අ. 0, රූ. 1. ප. 02) විශාලත්වය ඇති ඉඩම පුත්තලම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිවි 154/136 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-656

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.